සැ. යු. - 2026.07.10 වැනි දින පළ කරන ලද අංක 2497 *ගැසට් පත්‍රයේ* IV(අ) කොටස පළ නොවිය.

# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

**අංක 2,498 - 2026 ජූලි මස 17 සිකුරාදා - 2026.07.17**

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී.)

# IV (ආ) වැනි කොටස - පළාත් පාලනය

(වෙන වෙනම ගොනු කර ගත හැකි පරිදි සෑම කොටසකට ම අයත් එක් එක් භාෂාවකට වෙන වෙනම පිටු අංක යොදා ඇත.)

| | පිටුව |
|---|---|
| තනතුරු ඇබෑර්තු ... ... | — |
| විභාග, විභාග ප්‍රතිඵල ආදිය ... ... | 1074 |
| බඩුබාහිරාදිය විකිණීම් ... ... | — |
| පළාත් පාලන නිවේදන ... ... | 1078 |
| අතුරු ව්‍යවස්ථා ... ... | — |
| පළාත් පාලන සහා ඡන්ද ආඥාපනත යටතේ දැන්වීම් ... ... | — |
| ආදායම් හා වියදම් පිළිබඳ ප්‍රකාශන ... ... | 1080 |
| අයවැය ලේඛන ... ... | — |
| දේපළ විකිණීම් ... ... | — |
| විවිධ දැන්වීම් ... ... | 1081 |

*සැ. යු.* - සත්ව සුබසාධන පනත් කෙටුම්පත 2026.07.17 දින *ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ* II වැනි කොටසේ අතිරේකයක් වශයෙන් පළ කරන ලදී.

**සතිපතා නිකුත් වන *ගැසට්* පත්‍රයෙහි පළකිරීම සඳහා භාරගනු ලබන දැන්වීම් පිළිබඳ**

**වැදගත් නිවේදනයයි**

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට්* පත්‍රයේ අවසන් පිටුවේ සෑම මාසයකම මුල් සතියේ දී පළ කරන නිවේදන භාරගන්නා දිනයන් සහ වේලාවන් පිළිබඳව මින් අවධානය යොමු කරනු ලැබේ.

*ගැසට් පත්‍රයේ* පළකිරීම සඳහා දැන්වීම් භාරගැනීම *ගැසට්* පත්‍රය පළකරනු ලබන දිනයට සති දෙකකට පෙර සිකුරාදා දිනයෙහි දහවල් 12.00 ට අවසන් කරනු ලැබේ. තනතුරු - ඇබෑර්තු, විභාග, ටෙන්ඩර් සහ වෙන්දේසි පිළිබඳ දැන්වීම්වල අවසන් දින සහ වේලාවන් ඒ පිළිබඳව උනන්දුවක් දක්වන අයට ප්‍රමාණවත් කාල වේලාවක් ලැබෙන පරිදි යොදාගත යුතු බවට, සියලු ම දෙපාර්තමේන්තු, සංස්ථා සහ මණ්ඩල යනාදිය වගබලාගත යුතු බව මින් අවධාරණය කෙරේ. පළකිරීම සඳහා එවනු ලබන සෑම දැන්වීමක් ම තනි පැත්තේ පමණක් පැහැදිලිව පිටපත් කළ යුතු ය. නිරවද්‍යතාවය පිළිබඳව කරන විමසීම් සහ පැමිණිලි *ගැසට් පත්‍රය* පළ වූ දින සිට තෙමසකට පසුව භාරගනු නොලැබේ.

*ගැසට් පත්‍රයේ* පළකරන සෑම දැන්වීමක්ම *ගැසට් පත්‍රය* පළකරනු ලබන දිනට සති දෙකකට පෙර එනම්, 2026 අගෝස්තු මස 07 දින පළකරන *ගැසට් පත්‍රයේ* දැන්වීම් 2026 ජූලි මස 24 දින දහවල් 12.00ට හෝ ඊට පෙර) තැපෑලෙන් හෝ ගෙනවිත් රජයේ මුද්‍රණාලයට භාරදිය යුතු ය.

2006 අංක 19 දරන ඉලෙක්ට්‍රොනික ගනුදෙනු පනත - 9 වැනි වගන්තිය

"යම් ප්‍රකාශනයක්, රීතියක්, නියෝගයක්, නියමයක්, අතුරු ව්‍යවස්ථාවක්, නිවේදනයක් හෝ වෙනත් කිසිවක් *ගැසට් පත්‍රයේ* පළකළ යුතු බවට යම් පනතකින් හෝ නීති ප්‍රඥප්තියකින් විධිවිධාන සලස්වා ඇති අවස්ථාවක, ඒ රීතිය, නියෝගය, නියමය, අතුරු ව්‍යවස්ථාව, නිවේදනය හෝ වෙනත් දෙය ඉලෙක්ට්‍රොනික ස්වරූපයේ වන *ගැසට් පත්‍රයක* පළකරනු ලැබුවහොත් ඒ විධිවිධානය සම්පූර්ණ කර ඇත්තාක් සේ සැලකිය යුතු ය."

2026 අප්‍රේල් මස 02 දින,
කොළඹ 08,
රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ දී ය.

**ප්‍රසන්න ජයරත්න,**
රජයේ මුද්‍රණාලයාධිපති.

මෙම *ගැසට් පත්‍රය* www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.

# විභාග, විභාග ප්‍රතිඵල ආදිය

## නාවලපිටිය නගර සභාව

### නාවලපිටිය නගර සභාවේ රියදුරු (ප්‍රාථමික ශිල්පීය) තනතුරේ පුරප්පාඩු සඳහා දෛනික වැටුප් මත බඳවා ගැනීම

නාවලපිටිය නගර සභාවේ දැනට පුරප්පාඩු වී ඇති පහත උපලේඛනයේ තනතුරුවලට බඳවා ගැනීමට මධ්‍යම පළාත් පදිංචිකරුවන්ගෙන් පමණක් අයදුම්පත් කැඳවනු ලැබේ.

| *තනතුර* | *පුරප්පාඩු සංඛ්‍යාව* |
|---|---|
| රියදුරු (දෛනික) | 04 |

***බඳවා ගැනීමේ සුදුසුකම්***

01.1 බඳවා ගන්නා ශ්‍රේණිය : III ශ්‍රේණිය (දෛනික පදනම මත)

01.2 සුදුසුකම් :

01:2.1 අධ්‍යාපන සුදුසුකම් : අධ්‍යයන පොදු සහතික පත්‍ර සාමාන්‍ය පෙළ විභාගයේ දී දෙවරකට නොවැඩි වාර ගණනකදී යටත් පිරිසෙයින් සම්මාන 02 ක් සහිතව විෂයයන් 06ක් සමත් ව තිබීම, මින් විෂයන් 05 ක් එක් වරකදී සමත් වී තිබිය යුතුයි.

01.2.2 වෘත්තීය සුදුසුකම් : මෝටර් රථ ප්‍රවාහන කොමසාරිස් ජනරාල් විසින් නිකුත් කළ පහත තනතුර සඳහා අදාළ වන කාණ්ඩයේ මෝටර් රථ පැදවීමේ බලපත්‍රයක් ලබා තිබීම.

| *තනතුරු නාමය* | ***සම්පූර්ණ කළ යුතු සුදුසුකම්*** |
|---|---|
| රියදුරු | තාර බර හොන්ඩර 34 ට වැඩි බර මෝටර් වාහන බර ට්‍රේලර සහ මගීන් 32 ට නොවැඩි සංඛ්‍යාවක් ගෙන යා හැකි බස් රථ සඳහා රියදුරු බලපත්‍රයක් තිබීම. (බඳවා ගන්නා දිනට අවම වශයෙන් වසර 03 කට පෙර, මෝටර් රථ ප්‍රවාහන කොමසාරිස් විසින් 2009.03.11 දිනට පෙර නිකුත් කරන ලද “ඒ” වාහන පන්තියේ බලපත්‍රයක් හෝ නව රියදුරු බලපත්‍රය අනුව “ඩී” පන්තියේ බලපත්‍රයක් ලබා තිබීම.) |

01.2.3 **පළපුරුද්ද** : මෝටර් රථ පැදවීමේ බලපත්‍රය ලැබීමෙන් පසු අවම වසර 03 ක පළපුරුද්ද ලබා තිබීම. (පළපුරුද්ද සහතික මගින් සනාථ කළ යුතුය.)

01.2.4 **කායික සුදුසුකම් :**

I. සෑම අපේක්ෂකයෙකුම මනා ඇස් පෙනීමක් තිබිය යුතු අතර දිවා කාලයේ දී සහ රාත්‍රී කාලයේ දී සේවයේ යෙදීම පිණිස ප්‍රමාණවත් ශාරීරික හා මානසික යෝග්‍යතාවයෙන් යුක්ත විය යුතුය.

II. අවම උස අඩි 05 අඟල් 02 1/2 ක් විය යුතුය.

01.2.5 **වෙනත්**

I. පරම්පරාවෙන් හෝ ලියාපදිංචියෙන් ශ්‍රී ලාංකික පුරවැසියෙකු විය යුතුය.

II. අයදුම්කරුවන් මධ්‍යම පළාත තුළ පදිංචිකරුවන් විය යුතුය. වසර 03කට නොඅඩු ස්ථිර පදිංචි අයෙකු විය යුතුයි.

III. මහා මාර්ග නීති සංග්‍රහය ගැන මනා දැනුමකින් යුක්ත විය යුතුය.

IV. බඳවා ගැනීම සඳහා අවශ්‍ය සියලු සුදුසුකම්, එම සුදුසුකම් සම්පූර්ණ කර තිබිය යුතු බවට අයදුම්පත් කැඳවීමේ නිවේදනයේ/ *ගැසට් පත්‍රයේ* සඳහන් කරනු ලබන දිනට සෑම ආකාරයෙන්ම සම්පූර්ණ කර තිබිය යුතුය.

V. යහපත් චරිතයකින් යුක්ත විය යුතු අතර දිවයිනේ කවර ප්‍රදේශයක වුවද සේවය කිරීමට සුදුසු ශරීර සෞඛ්‍යයකින් යුක්ත විය යුතුය.

01.3 **වයස :**

01.3.1 අවම වයස් සීමාව : අවුරුදු 18 යි

01.3.2 උපරිම වයස් සීමාව : අවුරුදු 45 යි

01.4 **බඳවා ගැනීමේ ක්‍රමය :**

ලිඛිත පරීක්ෂණයක ප්‍රතිඵල මත ඉහළම ලකුණු ලැබූ අපේක්ෂකයන්ගෙන් වෘත්තීය පරීක්ෂණයක ප්‍රතිඵල මත අවශ්‍ය සියලුම සුදුසුකම් සපුරා ඇති අපේක්ෂකයින්ගෙන් ඉහළම ලකුණු ලැබූවන් අතුරින් කුසලතා අනුපිළිවෙල අනුව බඳවා ගනු ලැබේ.

01.4.1 ලිඛිත විභාගය : පහත සඳහන් පරිදි ලිඛිත පරීක්ෂණයක ප්‍රතිඵල මත ඉහළම ලකුණු ලැබූ අපේක්ෂකයන්ගෙන් පවතින පුරප්පාඩු මත වෘත්තීය පරීක්ෂණය සඳහා කැඳවනු ලැබේ.

**පළාත් පාලන රියදුරු සේවයට බඳවා ගැනීමේ තරග විභාගය**

1. විභාගය පිළිබඳ විස්තර :

| *ප්‍රශ්න පත්‍රය* | *කාලය* | *මුළු ලකුණු* | *මුළු ලකුණු සමත්වීමට අවශ්‍ය අවම ලකුණු ප්‍රමාණය* |
|---|---|---|---|
| 1. මාර්ග නීති සහ මොටර් යාන්ත්‍රික විද්‍යාව පිළිබඳ මූලික දැනුම | පැය 01 | 100 | 40% |
| 2. මෝටර් යාන්ත්‍රික විද්‍යාව පිළිබඳ මූලික දැනුම | පැය 01 | 100 | 20% |

2. මෙම පරීක්ෂණය නාවලපිටිය නගර සභාවේ ලේකම් විසින් පවත්නු ලැබේ.

3. තරග විභාගයට තමන් අධ්‍යාපනය ලැබූ භාෂා මාධ්‍යයෙන් හෝ රාජ්‍ය භාෂාවකින් හෝ ප්‍රශ්න පත්‍ර දෙකකට පිළිතුරු සැපයිය යුතු වේ.

4. සාමාර්ථය සඳහා එක් එක් විෂයට නියමිත මුළු ලකුණුවලින් අවම වශයෙන් සියයට හතළිහක් (40%) ලබා ගත යුතු වේ.

**5. විභාගය සඳහා විෂය නිර්දේශය :**

| *ප්‍රශ්න පත්‍රයේ නම* | *විෂය නිර්දේශය* |
|---|---|
| 1. මාර්ග නීති සහ මොටර් යාන්ත්‍රික විද්‍යාව පිළිබඳ මූලික දැනුම | මාර්ග නීති සහ මෝටර් යාන්ත්‍රික විද්‍යාව පිළිබඳ මූලික දැනුම සම්බන්ධ බහුවරණ ප්‍රශ්න පත්‍රයකි. |
| 2. මෝටර් යාන්ත්‍රික විද්‍යාව පිළිබඳ මූලික දැනුම | මෝටර් යාන්ත්‍රික විද්‍යාව පිළිබඳ මූලික දැනුම සම්බන්ධ බහුවරණ ප්‍රශ්න පත්‍රයකි. |

01.4.2 වෘත්තීය පරීක්ෂණය :

| *පරීක්ෂා කර ලබාදෙනු ලබන ශීර්ෂ* | *උපරිම ලකුණු ප්‍රමාණය* | *සමත්වීමට අවශ්‍ය අවම ලකුණු ප්‍රමාණය* |
|---|---|---|
| 1. රිය පැදවීමේ නිපුණතාවය/යන්ත්‍ර ක්‍රියාකරවීමේ නිපුණතාවය | 40 | ලිඛිත පරීක්ෂණයෙන් මුළු ලකුණු 40% හෝ ඊට වැඩියෙන් ලබාගත් අය පමණක් ප්‍රායෝගික පරීක්ෂණ මණ්ඩලය විසින් පවත්වනු ලබන රිය පැදවීමේ නිපුණත්වය මැනීමේ වෘත්තීය පරීක්ෂණයට පෙනී සිටිය යුතුය. අවශ්‍ය සියලුම සුදුසුකම් පරීක්ෂා කරනු ලැබීමෙන් පසු ඉහළම ලකුණු ලැබූවන් අතුරින් කුසලතා අනුපිළිවෙල අනුව බඳවා ගනු ලැබේ. |
| 2. මහා මාර්ග නීති පිළිබඳ ප්‍රායෝගික දැනුම | 40 | |
| 3. මෝටර් යාන්ත්‍රික විද්‍යාව පිළිබඳ මූලික දැනුම | 20 | |
| මුළු ලකුණු සංඛ්‍යාව | 100 | |

01.5 **අයදුම් කළ යුතු ආකාරය :**

මෙම නිවේදනයේ ආදර්ශ ආකෘතිය පරිදි 12" x 8" ප්‍රමාණයේ අයදුම්පත් සකස් කර "නාවලපිටිය නගර සභාවේ රියදුරු (ප්‍රාථමික ශිල්පීය) තනතුරේ පුරප්පාඩු සඳහා දෛනික වැටුප් මත බඳවා ගැනීම" ලෙස අදාළ කවරයේ වම්පස ඉහළ කෙළවරේ ලියා 2026.07.31 වැනි දිනට පෙර "ලේකම්, නගර සභාව, නාවලපිටිය" යන ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතුය. නියමිත දිනට නොලැබෙන අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ. අයදුම්පත් සමග පහත ලියකියවිලිවල සහතික කළ පිටපත් එවිය යුතුය.:

1. උප්පැන්න සහතිකය,
2. අධ්‍යාපන සහතික,
3. හැඳුනුම්පතේ ඡායාපිටපතක්,
4. පදිංචිය සනාථ කිරීමේ ග්‍රාම නිලධාරි සහතිකය,
5. මෑතකදී ගත් චරිත සහතික 02ක්,
6. වෘත්තීය සුදුසුකම් සම්බන්ධ සහතික,
7. පොලිස් වාර්තාව හා වලංගු රියදුරු බලපත්‍රය.

අයදුම්පත් කැඳවීමෙන් පසු හෝ කැඳවන අතරතුර කාලසීමාවේ දී හෝ මෙම බඳවා ගැනීම ප්‍රමාද කිරීම හෝ වෙනස් කිරීම හෝ මෙම නිවේදනය අවලංගු කිරීම හෝ සංශෝධනය කිරීම නාවලපිටිය නගර සභාවේ ලේකම් සතුය.

මෙම නිවේදනයේ සිංහල, දෙමළ අනුවාදයන් අතර කිසියම් අනනුකූලතාවයක් පවතී නම්, සිංහල නිවේදනයට අනුව අදාළ කරුණු බල පැවැත්වේ.

ලේකම්,
නගර සභාව, නාවලපිටිය.

2026 ජුලි මස 06 දින,
නාවලපිටිය නගර සභාවේ දී ය.

**ආදර්ශ අයදුම්පත්‍රය**

***නාවලපිටිය නගර සභාවේ රියදුරු තනතුර (දෛනික වැටුප් මත) සඳහා ඉල්ලුම් කිරීමේ අයදුම්පත්‍රය***

01. මුලකුරු සමග නම : ..........................................................................................................................................

02. සම්පූර්ණ නම : ..........................................................................................................................................

03. ජාතික හැඳුනුම්පත් අංකය : ..........................................................................

04. උපන් දිනය : වර්ෂය : ...................... මාසය : .................... දිනය :..................

05. අයදුම්පත් භාරගන්නා අවසාන දිනට වයස : අවුරුදු : ...................... මාස: .................... දින :..................

06. ස්ත්‍රී/පුරුෂ භාවය : ........................................................................

07. විවාහක/අවිවාහක බව : ....................................................................

08. ජාතිය : ........................................................

09. ස්ථිර ලිපිනය :..........................................................................................................................................

10. දුරකථන අංකය : ...................................................................

11. ඔබ ශ්‍රී ලංකා පුරවැසියෙක් ද? එසේ නම් පරම්පරාවෙන් ද? ලියාපදිංචියෙන් ද? යන බව :

12. අධ්‍යාපන සුදුසුකම් :

. අ.පො.ස.(සාමාන්‍ය පෙළ) විභාගය පිළිබඳ විස්තර

පළමු වතාව

වර්ෂය හා මාසය : ...................................

විභාග අංකය : ...................................

දෙවන වතාව

වර්ෂය හා මාසය : .................................

විභාග අංකය : ..................................

| *විෂයය* | *ශ්‍රේණිය* | *විෂයය* | *ශ්‍රේණිය* |
|---|---|---|---|
| 01 | | 01 | |
| 02 | | 02 | |
| 03 | | 03 | |
| 04 | | 04 | |
| 05 | | 05 | |
| 06 | | 06 | |
| 07 | | 07 | |
| 08 | | 08 | |

13. වෘත්තීය සුදුසුකම් : ..........................................................................................................................................

..........................................................................................................................................

14. පළපුරුද්ද : ..........................................................................................................................................

..........................................................................................................................................

මෙම අයදුම් පත්‍රයේ මා විසින් සපයන ලද තොරතුරු සත්‍ය හා නිවැරදි බවට මෙයින් සහතික කරමි. මෙහි ඇතුළත් තොරතුරු කිසිවක් අසත්‍ය බව මා මෙම තනතුරට තෝරා ගැනීමට පෙර අනාවරණය වුවහොත් මා නුසුදුස්සකු බවට පත්වන බවත්, තෝරා ගැනීමෙන් පසු දැනගතහොත් කිසිදු වන්දියක් නොගෙවා සේවයෙන් පහ කිරීමට යටත්වන බවත් පැහැදිලිව දන්වමි.

..................................

අයදුම්කරුගේ අත්සන.

දිනය :........................

**දෙපාර්තමේන්තු/ආයතන ප්‍රධානියාගේ සහතිකය**

මෙම අයදුම්පත ඉදිරිපත් කරන ..........................................................................................මයා/මිය/මෙනවිය මෙම දෙපාර්තමේන්තුවේ/ආයතනයේ ස්ථිර/තාවකාලික/අනියම්/ආදේශක වශයෙන් සේවය කරන බව සහතික කරමි. ඔහු/ඇය මෙම තනතුර සඳහා තෝරා ගතහොත් සේවයෙන් නිදහස් කළ හැකි/නොහැකි බව කාරුණිකව දන්වමි.

..................................

දෙපාර්තමේන්තු/ආයතන ප්‍රධානියාගේ අත්සන.

දිනය :........................

07-237

# පළාත් පාලන නිවේදන

## උඩුනුවර ප්‍රාදේශීය සභාව

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 24(01) වන වගන්තිය යටතේ කරනු ලබන දැන්වීමයි

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ 2026.02.27 දිනැති අංක 2478 දරන *ගැසට් පත්‍ර* මගින් 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 24 වැනි වගන්තිය ප්‍රකාර මධ්‍යම පළාතේ මහනුවර දිස්ත්‍රික්කයේ උඩුනුවර ප්‍රාදේශීය සභාව විසින් මෙහි පහත උපලේඛනයේ දක්වා ඇති මංමාවත් උඩුනුවර ප්‍රාදේශීය සභාව සතු මංමාවත් වශයෙන් ප්‍රකාශයට පත් කර ඇත.

ඉහත *ගැසට් පත්‍ර* මගින් ප්‍රදේශයේ පොදු ජනතාව මගින් හෝ මංමාවත්වලට අදාළ ඉඩම්වල අයිතිකරුවන් ලෙස හිමිකම්පාන පාර්ශ්වයන් හෝ යම් විරුද්ධත්වයක් පළ කරනු ලබන්නේ නම්, එම *ගැසට් පත්‍රයේ* පළ වූ දින සිට එක් මසක් ඇතුළත තමන්ගේ අයිතිය ඔප්පු කිරීම සඳහා 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 24(2) වගන්තිය ප්‍රකාරව කටයුතු කරන ලෙස දැනුම් දී ඇත.

එහෙත් මෙම කාල සීමාව තුළ 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 24(2) වගන්තිය ප්‍රකාර කිසිවෙකු ක්‍රියා කර නොමැති බැවින්, එකී *ගැසට්* නිවේදන මගින් ප්‍රකාශයට පත් කර ඇති පරිදි මෙහි පහත සඳහන් උපලේඛනයේ සඳහන් සියලුම මංමාවත් උඩුනුවර ප්‍රාදේශීය සභාව සතු මංමාවත් වශයෙන් පිළිගෙන පාලනය කරනු ලබන බව පොදු ජනතාවගේ දැන ගැනීම සඳහා මෙයින් ප්‍රකාශයට පත් කරමි.

ජී. ඊ. ජී. අසිත රණවීර,
සභාපති,
උඩුනුවර ප්‍රාදේශීය සභාව.

දුරකථන අංකය : 071-8184892/081-2310275
ෆැක්ස් අංකය : 081 -2311309
විද්‍යුත් තැපැල : udunuwaraps@gmail


**ලියාපදිංචි කළයුතු මාර්ග මිනින්දෝරු සැලැස්ම සහිතව**

| අනු. අංකය | ග්‍රාම නිලධාරි වසම | මාර්ගයේ නම | ආරම්භය | අවසානය | වම්පස පදිංචිකරුවන් | දකුණුපස පදිංචිකරුවන් | දිග මීටර්/ අඩි | පළල මීටර්/ අඩි |
|---|---|---|---|---|---|---|---|---|
| 01 | අංක - 38 ගෙලිඔය | ජය මාවත | ගෙලිඔය බුවැලිකඩ මාර්ගය | කේලමදෙණිය වත්ත | එස්. ජී. එස්. පී. බංඩාර<br>එච්. ජී. එස්. රත්නකුමාර<br>එම්. එදිරිවික්‍රමසූරිය<br>කේ. එම්. කේ. බණ්ඩාර | එච්. එල්. සී. පියනන්දන<br>එන්. එස්. දසනායක<br>ඩබ්ලිව්. එල්. කේ. පිටවල<br>එම්. ඒ. ඩී. ආර්. ගුණරත්න<br>එම්. ඒ. ඩී. රෝශිණී ගුණරත්න | මීටර් 134 | අඩි 10 |

C.S.LIYANAGE(M.S.I)
Registered Licensed Surveyor
Court Commissioner & Valuer
No.40, Isuru Pedesa,
Malkaduwawa,
Kurunagala.
Reg. No. 19700573

PLAN No: 13379

22 C




Reference

| | | |
|---|---|---|
| St | – | Stake |
| EP | – | Electric Post |
| CP | – | Cement Post |
| M | – | Mark |
| B | – | Bank |
| TP | – | Telephone Post |
| BW | – | Boundary Wall |
| RW | – | Retaining Wall |
| GP | – | Gate Post |
| LF | – | Live Fence |
| WF | – | Wire Fence |
| WNF | – | Wire Net Fence |
| Road(RDA) | – | Road(Road Development Authority) |

Scale 1 : 500

## PLAN

OF

JAYA MAWATHA

Situated at

G.N.Division No. 38, Gelioya

Dehipagoda Village

Within the Pradeshiya Sabha Limits of Udunuwara

in Ganga Palatha Korale of Udunuwara D.S.Division

KANDY DISTRICT – CENTRAL PROVINCE

Containing in Extent

| Lot No | Extent | | | | Remarks |
|---|---|---|---|---|---|
| | Hec. | A. | R. | P. | |
| 1 | 0.0466 | 0 | 0 | 18.42 | Road (10ft Road with 1 Feet Drain) |
| Total | 0.0466 | 0 | 0 | 18.42 | |

Length of "A" to "B" = 92m (302 Feet)

Length of "C" to "D" = 42m (138 Feet)

1) Survey as the Request of Owners of Land in Both side of Road
2) Boundaries pointed out by owners of the Land in both side of Road.
3) 'Jaya Mawatha' for Register in Udunuwara Pradeshiya Sabha

Surveyed on 31st of August 2025.

C.S. LIYANAGE (M.S.I)

07-220

# ආදායම් හා වියදම් පිළිබඳ ප්‍රකාශන

## පඩුවස්නුවර ප්‍රාදේශීය සභාව

මූල්‍ය ප්‍රකාශනය ප්‍රසිද්ධියට පත් කිරීම

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනත සමග කියවිය යුතු 1988 ප්‍රාදේශීය සභා (මූල්‍ය හා පරිපාලන) රීති මාලාවේ 216 රීතියේ විධිවිධානවලට අනුකූල වන පරිදි පහත උපලේඛනවල සඳහන් විගණනය කරන ලද පඩුවස්නුවර ප්‍රාදේශීය සභාවේ 2025.12.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වන මූල්‍ය මෙහෙයුම් ප්‍රකාශනය, 2025.12.31 දිනට මුදල් ප්‍රවාහ ප්‍රකාශය සහ 2025.12.31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය මහජනතාවගේ දැන ගැනීම සඳහා ප්‍රකාශයට පත් කරමි.

වයි. ජී. සංජීව කරුණාසාගර,
පඩුවස්නුවර ප්‍රාදේශීය සභාව,
හෙට්ටිපොල.

**පඩුවස්නුවර ප්‍රාදේශීය සභාව**

**2025 දෙසැම්බර් මස 31 දිනට මූල්‍ය තත්වය පිළිබඳ ප්‍රකාශය (රු.)**

| | *සටහන්* | *2025.12.31 රු. ශත* | *2024.12.31 රු. ශත* |
|---|---|---|---|
| **වත්කම්** | | | |
| *ජංගම නොවන වත්කම්* | | | |
| දේපළ, පිරියත සහ උපකරණ | 06 | 717,425,426 | 718,395,920 |
| *ජංගම වත්කම්* | | | |
| තොග | 07 | 8,334,775 | 8,929,799 |
| සේවක ණය හා අත්තිකාරම් | 08 | 16,911,126 | 12,329,682 |
| ලැබිය යුතු දෑ | 09 | 64,177,918 | 59,547,770 |
| ආයෝජන | 10 | 117,074,309 | 74,979,525 |
| මුදල් සහ මුදල් සමාන දෑ | 11 | 85,696,812 | 46,182,885 |
| | | 292,194,940 | 201,969,661 |
| **මුළු වත්කම්** | | **1,009,620,366** | **920,365,581** |
| *වගකීම්* | | | |
| ජංගම නොවන වගකීම් | 12 | 0 | 0 |
| ජංගම වගකීම් | 13 | 125,530,697 | 66,231,044 |
| හිමිකම් | 14 | 884,089,669 | 854,134,577 |
| **මුළු හිමිකම් සහ වගකීම්** | | **1,009,620,366** | **920,365,581** |

07-202

# විවිධ දැන්වීම්

**පාතහේවාහැට ප්‍රාදේශීය සභාව**

සංශෝධනයයි

**පාතහේවාහැට ප්‍රාදේශීය සභාව 2026 වර්ෂය සඳහා ඝාතක මඩු සඳහා ගාස්තු අය කිරීම**

2025.12.26 දින අංක 2470-471 දරන 2026 වර්ෂයේ පාතහේවාහැට ප්‍රාදේශීය සභාවේ සේවා ගාස්තු පැනවීම සම්බන්ධ *ගැසට් පත්‍රයේ* පළ කරන ලද, 2026 වර්ෂය සඳහා ඝාතක මඩු සඳහා ගාස්තු අය කිරීම පිටු අංක 14, 15 හි උපලේඛන - 1 හි අංක 07 යටතේ සඳහන් කර ඇති කුරුබාන් ගාස්තු එක් ගවයකු/බැටළුවකු/එළුවකු සඳහා රු. 5,000.00 ක මුදලක් අය කිරීම 2026.01.13 දින පැවති මහ සභාවේ යෝජනා අංක 10 යටතේ පහත පරිදි සංශෝධනය කර සභා සම්මත කරන ලද බව මහජනතාව වෙත මෙයින් නිවේදනය කරනු ලැබේ.

එච්. ජී. ඒ. පියල් ජයසිංහ,
උප සභාපති,
පාතහේවාහැට ප්‍රාදේශීය සභාව.

2026 ජූලි මස 08 වන දින,
පාතහේවාහැට ප්‍රාදේශීය සභා කාර්යාලයේ දී ය.

**යෝජනාව**

2025.10.14 දින පැවති මහ සභාවේ යථා පරිදි කල් දී ඇති යෝජනා අංක 05.18 යටතේ ඇති 2026 වර්ෂය සඳහා බදු සේවා ගාස්තු පැනවීම හා සම්බන්ධ *ගැසට් පත්‍රය* නිකුත් කිරීමට අදාළ බදු සේවා පැනවීමේ ගාස්තු කෙටුම්පත යටතේ 1.9 යෝජනාව වන පාතහේවාහැට ප්‍රාදේශීය සභාව 2026 සඳහා ඝාතක මඩු සඳහා ගාස්තු අය කිරීම යටතේ උපලේඛන 1 හි අනු අංක 07 හි සඳහන් කුරුබාන් ගාස්තු එක් ගවයකු/බැටළුවකු/එළුවකු සඳහා රු. 5,000.00 යන්න පරිච්ඡින්න කොට කුරුබාන් ගාස්තු එක් ගවයකු/බැටළුවකු/එළුවකු සඳහා රු. 1,000.00 ක් කළ යුතු බව පාතහේවාහැට ප්‍රාදේශීය සභාව යෝජනා කරන්නී ය.

**උපලේඛනය**

| *අනු. අංකය* | *I වන තීරුව* | *II වන තීරුව* |
|---|---|---|
| 1 | කුරුබාන් ගාස්තු අය කිරීම එක් ගවයකු/බැටළුවකු/එළුවකු සඳහා | රු. 1,000.00 |

07-321/1

---

**පාතහේවාහැට ප්‍රාදේශීය සභාව**

සංශෝධනයයි

**2026 වර්ෂය සඳහා පුස්තකාල සේවාවන් සඳහා ගාස්තු අය කිරීම**

2025.12.26 දින අංක 2470-471 දරන 2026 වර්ෂයේ පාතහේවාහැට ප්‍රාදේශීය සභාවේ සේවා ගාස්තු පැනවීම සම්බන්ධ *ගැසට් පත්‍රයේ* පළ කරන ලද, 2026 වර්ෂය සඳහා පුස්තකාල සේවාවන් සඳහා ගාස්තු අය කිරීම පිටු අංක 27හි උපලේඛනයෙහි අංක 2 යටතේ සඳහන් කර ඇති ඇප තැන්පත් ගාස්තුව සඳහා රු. 500.00 ක අය කිරීම 2026.01.13 දින පැවති මහ සභාවේ යෝජනා අංක 11 යටතේ පහත පරිදි සංශෝධනය කර සභා සම්මත කරන ලද බව මහජනතාව වෙත මෙයින් නිවේදනය කරනු ලැබේ.

එච්. ජී. ඒ. පියල් ජයසිංහ,
උප සභාපති,
පාතහේවාහැට ප්‍රාදේශීය සභාව.

2026 ජූලි මස 08 දින,
පාතහේවාහැට ප්‍රාදේශීය සභා කාර්යාලයේ දී ය.

**යෝජනාව**

2025.10.14 දින පැවති මහ සභාවේ යථා පරිදි කල් දී ඇති යෝජනා අංක 05.18 යටතේ ඇති 2026 වර්ෂය සඳහා බදු සේවා ගාස්තු පැනවීම හා සම්බන්ධ *ගැසට් පත්‍රය* නිකුත් කිරීමට අදාළ බදු සේවා පැනවීමේ ගාස්තු අය කිරීම යටතේ පුස්තකාල ඇප තැන්පත් ගාස්තු රු. 500.00 යන්න පරිච්ඡින්න කොට පුස්තකාල ඇප තැන්පත් ගාස්තු රු. 100.00 කළ යුතු බව පාතහේවාහැට ප්‍රාදේශීය සභාව යෝජනා කරන්නී ය.

**උපලේඛනය**

| *අනු. අංකය* | *I වන තීරුව* | *II වන තීරුව* |
|---|---|---|
| 1 | පුස්තකාල ඇප තැන්පත් ගාස්තු | රු. 100.00 |

07-321/2

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.